#MediaEthicsSL #EnglishPress #SinhalaPress #TamilPress #Ika #DailyNews #DailyMirror #TheIsland #CeylonToday #Divaina #Dinamina #Lankadeepa #Thinakaran #Virakesari #Thinakkural #Resa #Mawbima #Ada

මොරටුවෙන් අල්වා ගත් මත්ද්‍රව්‍ය සහ සොයාගත් ජීව උණ්ඩ ප්‍රමාණයන් මෙන්ම ඒවායේ වටිනාකම සිංහල භාෂා, දමිළ භාෂා සහ ඉංග්‍රීසි භාෂා පුවත්පත් කිහිපයක දක්වා ඇති ආකාරය පහත දැක්වේ. මෙහිදී නිරීක්ෂණය කළ හැකි වන්නේ, එම පුවත්පත් තුල සඳහන් වන දත්ත යම් යම් වෙනස්කම් වලින් යුක්ත වන බවයි. බොහෝ පුවත්පත් තුළ පොලිස් මාධ්‍ය ප්‍රකාශක රුවන් ගුණසේකර මහතාව සිය මූලාශ්‍රය වශයෙන් උපුටා දක්වා තිබෙන අතර, තවත් පුවත්පත් මගින් පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය, පොලිස් මාධ්‍ය අංශය යන මූලාශ්‍ර දක්වා ඇත. කෙසේ වෙතත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාව උපුටා දක්වා තිබෙනා පුවත් වාර්තාවන් තුළ පවා එකිනෙකට යම් යම් ලෙසින් වෙනස් වූ අගයන් දක්වා තිබෙනා බවද සැලකිල්ලට ගත යුතුවේ.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක රුවන් ගුණසේකර විසින් ජනමාධ්‍ය වෙත මේ සම්බන්ධයෙන් සිදුකළ ප්‍රකාශයේ සඳහන් වන ආකාරයට, ගිනි අවි කිහිපයකට අමතරව ටී-56 ජීව උණ්ඩ 2083 ක්, පිස්තෝල වලට භාවිතා කෙරෙන මිලිමීටර් 8 ජීව උණ්ඩ 91 ක ප්‍රමාණයක් සහ රුපියල් මිලියන 1800 කට අධික වටිනාකමකින් යුත් හෙරොයින් කිලෝ 167 ක පමණ ප්‍රමාණයක් සොයාගැනීමට හැකි වී ඇත (මූලාශ්‍රය: පොලිස් මාධ්‍ය ප්‍රකාශක රුවන් ගුණසේකර, අද දෙරණ රාත්‍රී 10.00 පුවත් - https://www.youtube.com/watch?v=9LYBswc8N_k&t=248)

මෙහිදී හෙරොයින් සඳහා නිශ්චිත වටිනාකමක් ලබාදීමට නොහැකි බව වටහා ගත හැකි කරුණකි. කෙසේ නමුත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාව උපුටා දක්වන පුවත් වාර්තාවක පවා සොයාගත් හෙරොයින් ප්‍රමාණය සහ ජීව උණ්ඩ ප්‍රමාණයන් වෙනස් වීමට හේතුව කුමක්ද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?